**සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති සංරචක-II -2023**

**-----------------------------------------------------------------------**

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සංරචක - II හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2018 ජූලි 25 දින එළඹි අංක 6228 LK දරන ණය ගිවිසුමේ 5.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම, ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තාක්ෂණික සහාය යන සංරචක දෙකක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 449,645 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 2,900ක් වන අතර ඉන් රු. මිලියන 15,505 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 100 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 434,140 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2018 අගෝස්තු 30 දින ආරම්භ කරන ලද අතර, 2024 ජූනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්**,** ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2026 ජූනි දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

# 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු/විගණන නිරීක්ෂණය | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂයේ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් වැඩියෙන් දක්වා තිබුණි. | 65 | 2022 වර්ෂයේ වියදමක් වැරදීමකින් 2023 වර්ෂයේ අවසාන ගිණුම්වල 2023 වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත්, විගණනය මගින් දක්වා ඇති පරිදි 2024 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී මෙම වියදම නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතියේ II වන සංරචකය මගින් සපයනු ලබන පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන දීමනා මූල්‍ය ප්‍රකාශනවල ධාරිතා සංවර්ධන වියදම් ලෙස දක්වා තිබුණි. | 144.2 | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය සැකසීමේදී මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වියදම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2015 මැයි 20 දිනැති අංක 11/2015 දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | මහජන දිනය තුළ රැස්වීම්, සම්මන්ත්‍රණ, උත්සව සංවිධානය නොකළ යුතු වුවත් මහජන දිනයේදී සම්මන්ත්‍රණ පවත්වා තිබුණි. | සඳුදා වැඩමුළු පැවැත්වීමෙන් වළකින ලෙස දැනුවත් කරන ලදී. | නීති රීති හා රෙගුලාසි අනුගමනය කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 96 ඡේදය | අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු වුවද, 2023 වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මේ ව්‍යාපෘතිය හඳුනාගෙන නොතිබුණි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතියේ 2019 සහ 2020 වර්ෂ ආවරණය වන පරිදි ගණිතය, ඉංග්‍රීසි සහ විදේශ භාෂා ශාඛාව සම්බන්ධයෙන් 2023 මැයි මාසයේදී අභ්‍යන්තර විගණන වාර්තාවක් නිකුත් කර තිබුණද, 2021, 2022 සහ 2023 යන වර්ෂ ආවරණය වන පරිදි වාර්තා නිකුත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන සැලැස්මේ සඳහන් ක්‍රියා අට හරහා මෙම GEMP ව්‍යාපෘතිය විදේශීය ව්‍යාපෘතියක් යටතේ සිදු කිරීමට සැලසුම් කර ඇත. | නීති රීති හා රෙගුලාසි අනුගමනය කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය ඒකක | 2023 දෙසැම්බර් 31 දිනට ළඟා කරගෙන ඇති කාර්යසාධනය ඒකක | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| II | පාසැල් ආධාර. | 69 | 0 | 2022 වර්ෂය සඳහා 2022 දෙසැම්බර් 16 වැනි දින පාසල් 69ක් සඳහා ප්‍රදාන මගින් ලබාදුන් රු.මිලියන 50.2ක මුදලක් වැයකර අවසන් කිරීම 2023 අගෝස්තු 31 දක්වා දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණද, ඊට අදාළ මූල්‍ය ප්‍රගතියේදී | පාසල්වලට මුදල් තැන්පත් කිරීමේ ප්‍රමාදය. |

පාසල් 69ක් සඳහා ලබාදුන් රු. මිලියන 50.2කට අදාළව 2023 දෙසැම්බර් 31 වන විටත් අධ්‍යාපන අමාත්‍යාංශයට ප්‍රගතිය ලබාදී නොතිබුණි.

| | |
|---|---|
| **කළමනාකාරීත්වයේ ප්‍රතිචාර** | පාසල්වලට මුදල් තැන්පත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රදානය යටතේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට පාසල්වලට 2024 මාර්තු දක්වා දීර්ඝ කරන ලදී. |
| **විගණකගේ නිර්දේශයන්** | ව්‍යාපෘති අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතුය. |

**3.2 ව්‍යාපෘති පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මෙහෙයුම් අත්පොත ප්‍රකාරව ව්‍යාපෘතියේ සංරචක I යටතේ විසර්ජන සම්බන්ධිත දර්ශක ක්‍රියාත්මක කළ යුතු වුවද, සංරචක II යටතේ රු. මිලියන 144.2 ක මුදලක් පාසල් සඳහා ලබා දී තිබුණි. | GEM ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම් බොහොමයක් පාහේ පාසල් පාදක ක්‍රියාකාරකම් ලෙස සිදු කෙරෙන බැවින්, පාසල්වලට මෙහෙයුම් ක්‍රියාකාරකම් මෙන්ම තාක්ෂණික සහාය අවශ්‍ය වේ. මෙය සැලකිල්ලට ගනිමින් පාසල් පාදක ඉගෙනුම් වැඩිදියුණු කිරීමේ ප්‍රදානය II වන සංරචකය භාවිතා කර පාසල් වෙත යැවීමට කටයුතු කර ඇත. | ව්‍යාපෘතියේ අරමුණ සඳහා මූල්‍යකරණය කළ යුතුය. |

**3.3 පද්ධති ශා පාලන**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශාඛාවන්හි විෂය සම්බන්ධ කාර්යයන් හා එම ශාඛාවල විධායක නිලධාරීන්ගේ රාජකාරි ලැයිස්තුවල ඇතුළත් රාජකාරි කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා දරන ලද රු. මිලියන 2 ක වියදම ධාරිතා සංවර්ධන වියදම් ලෙස දක්වා තිබුණි. | ව්‍යාපෘති ඩීඑල්අයි සහ අදාළ ශාඛාවල රාජකාරි බොහෝ දුරට එකිනෙකට සම්බන්ධ වී ඇති අතර එය වෙන වෙනම හඳුනාගත නොහැක. එබැවින්, මෙහි සඳහන් ධාරිතා සංවර්ධනය DLIs හා සම්බන්ධව සිදු කරන බව. | වියදම් නිසි ලෙස කළමනාකරණය කළ යුතුය. |
| (ආ) | අදාළ ඉලක්ක ජයගත හැකි ලෙස සැලසුම් සහගතව පාසල් වෙත ප්‍රතිපාදන ක්‍රමානුකූලව ලබාදිය යුතු වුවත් ඒ පිළිබඳව අවධානය යොමු කිරීමකින් තොරව 2023 සැප්තැම්බර් 5 දින පාසල් 130ක් සඳහා රු. මිලියන 65ක මුදලක් ද 2023 දෙසැම්බර් 29 දින රු. මිලියන 29 ක මුදලක් ද පිළිවෙලින් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, පසුගිය වසර 02 තුළ ලබා දුන් පාසල් ප්‍රතිපාදනවල සාර්ථක ප්‍රගතියක් නිරීක්ෂණය කළ නොහැකි විය. | C2 හි අරමුදල් නොමැතිකම හේතුවෙන්, C2 යටතේ SBLEG සඳහා වෙන් කරන ලද මුදල් පාසල් වෙත යවා නොමැති අතර, SBLEG සඳහා C1 හරහා වෙන් කළ අරමුදල් පමණක් බෙදා හැර ඇත. | ව්‍යාපෘති අරමුදල් ඵලදායී ලෙස යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘතියේ විසර්ජන සම්බන්ධිත දර්ශක (DLI) සාක්ෂාත් කර ගැනීම පිළිබඳ තෙවන පාර්ශවීය තහවුරු කිරීමේ වාර්තාව විගණිත වර්ෂයට අදාළව ඊළඟ වසරේ පෙබරවාරි 28 දිනට පෙර ලෝක බැංකුව වෙත ලබා දිය යුතු වුවද, 2023 වර්ෂයට අදාළ වාර්තා සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එම වාර්තා ඉදිරිපත් කිරීමට අදාළ ඇගයීම් 2024 මැයි මාසය වන විටත් අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | කොවිඩ් සහ අනෙකුත් අර්බුදකාරී තත්ත්වයන් හේතුවෙන් තෙවන පාර්ශවීය වලංගුකරණයට අදාළ ක්‍රියාවලිය ප්‍රමාද විය. 2023 අධ්‍යයන වර්ෂය සඳහා ද, 2023 අධ්‍යයන වර්ෂය 2024 පෙබරවාරි මස අවසන් වූ බැවින්, මේ වන විට තුන්වන පාර්ශවීය වලංගුකරණය ක්‍රියාවලියේ පවතියි. | නියමිත කාලය තුළ වාර්තා ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | කලින් එවා ඇත. | ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |